# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,371—1962 නොවැම්බර් 2 වැනි සිකුරාදා—1962.11.2

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි, සැම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොද ඇත.)

| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 1495 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය | 1496 |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 1497 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1498 |
| මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1502 |
| "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | 1505 |

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 438

අංකය : බී/වීඑප් 16/ඒ.

### යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

1961 ඔක්තෝබර් මස 1 වැනි දින සිට මේජර් වශයෙන් :—

කපිතාන් ජෝන් උපනන්ද රාජපක්ෂ, ස්ව. රෙ.

1961 ඔක්තෝබර් මස 1 වැනි දින සිට මේජර් (උපකරණ පාලක) වශයෙන් :—

කපිතාන් (උපකරණ පාලක) ක්‍රිස්ටෝපර් වෝල්ටර් ජෝන් පුල්ලේ, ස්ව. රෙ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කියු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1962 ඔක්තෝබර් 20 වෙනිදා,
කොළඹ දීය.

11-187

---

1962 අංක 439

අංකය : බී. 11/රෙක් ට.

### යුද්ධ හමුදාව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද අධිකාරටය පත් කිරීමක්

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් 1962 ඔක්තෝබර් 26 වැනි දින සිට පහත නම් සඳහන් කර ඇති වොරන්ට් ඔපිසර් ව යුද්ධ හමුදා නිත්‍ය හට සේනාවේ ලුතිනන් (ක්වාටර් මාස්ටර්) කෙනෙකු වශයෙන් අධිකාරයකුට පත් කිරීම හා ඔහුව යුද්ධ හමුදා යුද්ධායුධ බලකායට එම දින සිට ඇතුළත් කිරීම අනුමත කොට තිබේ.

එස්/87131 වොරන්ට් ඔපිසර් 1 පිලිප් බෙනිට් ඇන්තනී ගුණවර්ධන—ලංකා යුද්ධ හමුදා යුද්ධායුධ බලකාය.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කියු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1962 ඔක්තෝබර් 25 වෙනිදා,
කොළඹ දීය.

11-202

---

1962 අංක 440

අංකය : සී.82/යුකේ පී.

### ගුවන් හමුදා පණත

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් ගුවන් හමුදා පණතේ (359 වන අධිකාරය) 8 (1) යන වගන්තිය යටතේ රාජකීය ලංකා ගුවන් හමුදාවේ, ජ්‍යෙෂ්ඨ ගුවන් මාණ්ඩලික නිලධාරී ඩී. ඇෆ්. සී. නාමධාරී, ග්‍රුප් කපිතාන් ඊ. ආර්. අමරසේකර, 1962 ඔක්තෝබර් 23 දින සිට, සී. බී. ඊ., ඩී. ඇෆ්. සී., ආර්. ඒ. ඇෆ්. නාමධාරී එයාර් වයිස් මාර්ෂල් ජේ. ඇල්. බාර්කර් ආපසු දිවයිනට පැමිණෙන තුරු ගුවන් හමුදාධිපති වශයෙන් වැඩ බැලීමට පත් කොට ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කියු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1962 ඔක්තෝබර් 22 වෙනිදා,
කොළඹදීය.

11-32

ඇල්.ඩී.—බී. 129/47. අංකය :- සී. 5/56.

## 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජාඥාව

### 61 වෙනි වගන්තිය යටතේ ආඥාව

1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජාඥාවේ 61 වෙනි වගන්තිය යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ආඥාව.

නිශ්ශංක විජයරත්න,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 ඔක්තෝබර් මස 26 වෙනි දින,
කොළඹ දීය.

### අංක 148 දරණ ආඥාව

1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජාඥාවේ 61 වෙනි වගන්තිය යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සම්පාදිතව, 1958 අගෝස්තු මස 1 වෙනි දින හා අංක 11,465 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ පසුව සංශෝධනය කරන ලද අංක 112 හා 1958 ජූලි මස 23 වෙනි දින දරණ ආඥාව, එහි උපලේඛනයෙහි, "කච්චේරි" යන ශීර්ෂය යටතේ 1 වෙනි තීරයෙහි "පියුන්වරුන් හා පණිවුඩකරුවන්" යන වචන වලට ඉක්බිතිවම පහත සඳහන් වචන, එනම් :— "ආයුධ ශුද්ධ කරන්නා" යන්න ඇතුළත් කිරීමෙන් මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

11-236

---

## 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනත

### ආඥාව

1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 වෙනි වගන්තියේ (1) හා (8) වෙනි උප වගන්තිවලින් හා 4 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පිදී, අධිකරණ අමාත්‍ය සැමුවෙල් පීටර් ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු වන මම, මෙයින්—

(අ) පහත සඳහන් තැනැත්තන් කලුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි අධිකාරිපත්තු ගම්ප්‍රදේශය සඳහා සමන්විත සමගි මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් පත්කරමි :—

(1) වීදාගම පදිංචි ඊ. ඒ. බණ්ඩාර මහතා.
(2) අළුත්ගම පදිංචි ආතර් සිල්වා රණසිංහ මහතා.
(3) බමුණුමුල්ල පදිංචි බුසිගේ ඇල්බට් පෙරේරා මහතා.
(4) මස්විල පදිංචි ගෝනදූවගේ ජේම්ස් පෙරේරා මහතා.
(5) අළුත්ගම පදිංචි රණසිංහගේ සරදියෙල් සිල්වා මහතා.
(6) ගම්මන්පිල පදිංචි වික්‍රමගේ ගුනේරිස් පෙරේරා මහතා.
(7) කඹුරුගොඩ පදිංචි වික්‍රමගේ ජොහානිස් සිල්වා මහතා.
(8) රඹුක්කන පදිංචි පලිහේන්ගේ සිරිසේන පෙරේරා ජයතිලක මහතා.
(9) බණ්ඩාරගම පදිංචි සිරිදියෙස් වැබුයුලට් පෙරේරා සමරනායක මහතා.
(10) වීදාගම පදිංචි ඩී. හේනාධීර මහතා.
(11) වීදාගම පදිංචි ඩී. එල්. අතපත්තු මහතා.
(12) කිත්දෙල්පිටිය පදිංචි සුමන අක්මීමන මහතා.
(13) කිත්දෙල්පිටිය පදිංචි හපුආච්චිගේ මාටින් පෙරේරා මහතා.
(14) අටුලුගම පදිංචි අබ්දුල් රහුමන් හාජියාර් අබ්දුල් හාපික් මහතා.
(15) අටුලුගම පදිංචි මොහමඩ් ලෙබ්බේ අබ්දුල් කපූර් මහතා.
(16) වීදාගම පදිංචි එස්. මිත්‍රසේන මහතා.
(17) ගල්තුඩේ පදිංචි ගනේගොඩගේ සයිමන් රොද්‍රිගො මහතා.
(18) වැවිට පදිංචි අප්පකුට්ටි ආරච්චිගේ ජයම්පති නිස්සන්ක මහතා.
(19) රඹුක්කන පදිංචි උඩුවගේ සුගතදාස පෙරේරා මහතා.
(20) රයිගම පදිංචි සූරියආරච්චිගේ පූර්ණසේන පෙරේරා මහතා.
(21) කඹුරුගොඩ පදිංචි ගමගේ ලුවිස් පෙරේරා මහතා.
(22) බණ්ඩාරගම පදිංචි ඩයිනස් විජේවංශ වික්‍රමසිංහ මහතා.
(23) වීදාගම පදිංචි මදනායකගේ දෙන් මිත්‍රසේන මහතා.
(24) වල්ගම, ගම්මන්පිල පදිංචි පතිරගේ නැපෝසිංඤෝ මහතා.
(25) කොතලාවල පදිංචි කලුආරච්චිගේ දෙන් අබයදාස පෙරේරා මහතා.
(26) බණ්ඩාරගම පදිංචි වැලිවිටියගේ චාර්ලින් රොද්‍රිගෝ මහතා.
(27) අටුලුගම පදිංචි මොහමඩ් හලීල් මොහමඩ් සමූන් මහතා.

(ආ) ඉහතකී මණ්ඩලයේ සභාපති වශයෙන් වීදාගම පදිංචි ඊ. ඒ. බණ්ඩාර මහතා පත්කරමි ; තවද

(ඇ) එබඳු එක් එක් සාමාජිකයා නිලය දැරිය යුතු කාලසීමාව, මේ ආඥාව ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දින සිට අවුරුදු 2 ක් වියයුතු යයි නිශ්චය කරමි.

සැම් පී. සී. ප්‍රනාන්දු,
අධිකරණ අමාත්‍ය.

1962 ඔක්තෝබර් මස 23 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේ දීය.

11-237/1

---

## පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ රක්ෂිත ස්මාරක පිළිබඳ උපදේශක සභාව

රක්ෂිත ස්මාරක නැහැවිරීම් ඇදිය පිළිබඳ ප්‍රශ්නවලදී පුරාවිද්‍යා කොමසාරිස්වරයාට උපදෙස් දීම සඳහා 1940 අංක 9 දරණ පුරාවිද්‍යා ආඥා පනතේ 21 (2) දරණ රෙගුලාසිය යටතේ 1961 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1964 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා වූ කාලය සඳහා ගරු කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සභාපති නැත උතුරුමැද පළාතේ ස්මාරක පිළිබඳ උපදේශක මණ්ඩලයට පත්කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇම්. ජේ. පෙරේරා,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම් වෙනුවට.

1962 ඔක්තෝබර් මස 22 වැනි දින,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
කොළඹ 7.

11-12

---

ගාල්ල සහ බලපිටිය අධිකරණ කොට්ඨාශයන්හි ක්වාසි වරයා ලෙස පත්කරන ලද, ගාල්ලේ, රිච්මන් පාරේ අංක 45 හි පදිංචි අබ්දුල් හසන් ජමල්දීන් මහතාගේ පත්වීම, මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපනතේ (115 වෙනි පරිච්ඡේදයේ) 12 (6) වෙනි වගන්තිය යටතේ ගරු කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් 1962 නොවැම්බර් මස 16 වැනි දින සිට අවලංගු කරන ලද බව මෙයින් දන්වමි.

කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1962 ඔක්තෝබර් මස 17 දින,
කොළඹ දීය.

11-131

---

## ලංකා වෛද්‍ය විද්‍යාල සභාව

(105 අධිකාරිය වන) වෛද්‍ය ආඥාපනතේ 5 (1) (i) වැනි වගන්තිය යටතේ ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් ලංකා වෛද්‍ය විද්‍යාල සභාවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීමට රජයේ බෙහෙත් ගබඩාධිකාරි ඩී. ඒ. ඒ. මුණසිංහ මහතා නැවත පත්කරන්නට යෙදුන බැව් මෙයින් නිවේදනය කරමි.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ සථිර ලේකම්.

11-56

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ජේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ජේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මඟින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා.

1962 ඔක්තෝබර් මස 15 දින දීය,
කොළඹ 2.

#### උපලේඛනය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගිරියාල හත්පත්තුව ආදායම් නිලධාරි කොට්ඨාශයේ අංක 122 දරණ කන්දෙගෙදර පළාත ගම්මුලාදෑනි වසමේ පිහිටි අංක 1235 දරණ අන්තිම ගම් සිතියමේ ලොට් 97 ජී. දරණ පොලේවත්ත නොහොත් ඇල්ලේහේන නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර දෙකක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස ; නැගෙනහිරට : එම සැලැස්මේ ලොට් ජී. 114 සහ ජී. 119 ; දකුණට : එම සැලැස්මේ ලොට් කිව්. 115 සහ ජී. 116 ; බස්නාහිරට : කුරුණෑගල-දඹුල්ල ප්‍රසිද්ධ පාර.

11-64

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ජේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ජේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මඟින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා.

1962 ඔක්තෝබර් මස 15 දින දීය,
කොළඹ 2.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, පහළ හේවාහැට ආදායම් නිලධාරි කොට්ඨාශයේ, මයිලපිටිය ගම්මුලාදෑනි වසමේ පිහිටි, කිවුල් තැන්න වතුයාය නැමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 1 1/4 ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : ඩී. ජී. සමරවීර මහතාට අයිති කුඹුර ; නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට : වතුයායට යන පාර ; බස්නාහිරට : ජී. ඇල්. සිරිවර්ධන මහතාට අයිති ඉඩම්.

11-63

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ජේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ජේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මඟින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා.

1962 ඔක්තෝබර් මස 15 දින දීය,
කොළඹ 2.

#### උපලේඛනය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, අංක 430 දරණ කබලෑව පළාත ගම්මුලාදෑනි වසමේ පිහිටි අගාරේවත්ත නැමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 3 ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : අඩි අටක් පළලැති කරත්ත පාර සහ පුද්ගලික ඉඩම් ; නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට : කදුරු ගස් හේන-බෝවත්ත ප්‍රසිද්ධ පාර ; බස්නාහිරට : කදුරු ගස් හේන-බෝවත්ත ප්‍රසිද්ධ පාර.

11-62

## දැන්වීමයි

### විත්‍රපටි කොමිෂන් සභාව

විත්‍රපටි කොමිෂම වෙත ලිපි ලේඛණ ඉදිරිපත් කිරීමට දී ඇති කාලසීමාව 1962 නොවැම්බර් මස 15 වැනිදා දක්වා දීර්ඝ කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. ලිපි ලේඛන ආදියක් නොඑවා කොමිෂම ඉදිරියේ සාක්ෂි පමණක් ප්‍රකාශ කිරීමට කැමති අය ඒ බව කොමිෂම වෙත දැන් වුවහොත් ඉඩකඩ සලසා දෙනු ලැබේ.

3. රහසිගතව සාක්ෂි ඇසීමට ද විධිවිධාන යොදා ඇත.

ඩබ්. ආර්. බී. රාජකරුණා,
විත්‍රපටි කොමිෂන් සභාවේ ලේකම්.

කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
ටොරිංටන් චතුරශ්‍රය,
කොළඹ 7,
1962 ඔක්තෝබර් මස 30 දිනදීය.

11-279

(1506 වෙනි පිට හා සම්බන්ධයි)

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මාතලේ දිස්ත්‍රික්කයේ තුවක්කු 1963 වර්ෂයට අළුත් කිරීම

මාතලේ දිස්ත්‍රික්කයේ, රිවෝල්වර් සහ පිස්තෝල බලපත්‍ර හැර අනික් තුවක්කු බලපත්‍ර 1963 වර්ෂය සඳහා අළුත් කිරීම ඒ ඒ කොට්ඨාශවල ප්‍රාදේශීය ආදායම් නිලධාරීන් විසින් 1962 නොවැම්බර් මස 15 වෙනි දින සිට කරනු ලබන බව මහාජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. රිවෝල්වර් සහ පිස්තෝල බලපත්‍ර අළුත් කිරීම මාතලේ කච්චේරියේදී ඉහත සඳහන් දින සිට කරනු ලැබේ.

2. තුවක්කු සඳහා දී ඇති සෑම බල පත්‍රයක්ම 1962 දෙසැම්බර් මස 31 වෙනිදාට පෙර 1963 වර්ෂය සඳහා අළුත් කර ගන්නා ලෙස අවවාද වශයෙන් දන්වනු ලැබේ. බලපත්‍ර අළුත් කිරීමේ දී පරණ බලපත්‍රද සෝදිසි කිරීම පිණිස එම තුවක්කු ද ඒ ඒ නිලධාරි වෙත ඉදිරිපත් කළ යුතුය.

3. යමෙකු 1962 දෙසැම්බර් මස 31 වෙනි දිනට ප්‍රථම බලපත්‍ර අළුත් කර නොගන්නෙහි නම්, එවැනි බලපත්‍රයක් නියමිත කාලයෙන් පසුව අළුත් කිරීමේදී බලපත්‍ර ගාස්තු මුදලින් 100% අතිරේක දඩ මුදලක් ගෙවා අළුත් කරගන්නට සිදුවේ. යම්කිසි හේතුවක් නිසා බලපත්‍රයක් අළුත් කර නොගන්නෙහි නම්, එම බලපත්‍රයද, තුවක්කුව ද බලපත්‍ර නිකුත් කරන නිලධාරි වෙත 1962 දෙසැම්බර් මස 31 වෙනි දින හෝ ඊට පෙර භාර දිය යුතුය.

4. 1963 වර්ෂයට නිකුත් කරන ලද තුවක්කු බලපත්‍රයක් බලපත්‍ර නිකුත් කරන නිලධාරි තුමාට භාරදීම පිණිස යමෙකු ළඟ නැත්නම් එවැනි බලපත්‍රයක් සහතික පිටපතක් නිකුත් කිරීම සඳහා නියමිත බලපත්‍ර ගාස්තුවට අතිරේකව තවත් රුපියලක් ද ගෙවන්නට සිදුවේ.

5. 1963 මාර්තු 31 වෙනි දිනට ප්‍රථම තුවක්කු බලපත්‍ර අළුත්කර නොගන්නා අයට විරුඹව නඩු පවරන බව ද සැලකිය යුතුයි.

කේ. බී. දිසානායක,
මාතලේ දිසාපති සහ බලපත්‍ර නිකුත් කිරීමට
බලය ලත් නිලධාරි තැන.

1962 ඔක්තෝබර් මස 13 වෙනි දින,
මාතලේ දිසාපති කායනීලයේදීය.

11-3.

---

## හම්බන්තොට දිස්ත්‍රික්කයේ 1963 වර්ෂයට තුවක්කු බලපත්‍ර අළුත්වැඩියා කිරීම

හම්බන්තොට දිස්ත්‍රික්කයේ 1963 වර්ෂයට තුවක්කු පාවිච්චි කිරීමේ බලපත්‍ර අළුත් කිරීම හා අළුතෙන් බලපත්‍ර නිකුත් කිරීම ඒ ඒ කොට්ඨාශවල ප්‍රාදේශීය ආදායම් නිලධාරීන් විසින් 1962 නොවැම්බර් මස 15 වැනි දින සිට 1962 දෙසැම්බර් 31 වැනිද දක්වා කරනු ලබන බවද මේ සඳහා ඉල්ලුම් පත්‍ර කොට්ඨාශයේ ආදායම් නිලධාරිතැන වෙත යැවිය යුතු බවද මහා ජනයා වෙත මෙයින් දැනුම් දෙමි.

මෙම කාලය තුළ බලපත්‍ර අළුත්කිරීම ගැන ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍ර හම්බන්තොට කච්චේරියේදී භාරගනු නොලැබේ.

2. බලපත්‍ර අළුත් කිරීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රවල සඳහන් සෑම තුවක්කුවක්ම එම බලපත්‍ර නිකුත් කරන නිලධාරිතැන වෙත පරීක්ෂණය පිණිස ඉදිරිපත් කළ යුතුයි.

3. තුවක්කු ලබාගැනීම සහ පාවිච්චි කිරීම සඳහා දෙන ලද සෑම බලපත්‍රයක් ම 1962 වර්ෂය අවසානයේ දී අවලංගු වන බවද 1963 වර්ෂය සඳහා බලපත්‍ර 1962 දෙසැම්බර් 31 වැනි දිනට පෙර නියමිත ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කාර්යාලයේ දී අළුත් කළ යුතු බවද වැඩි දුරටත් මහජනයා වෙත මෙයින් දනුම් දෙමි. 1963 ජනවාරි මස 1 වැනිදා සිට 1963 මාර්තු 31 වැනි දින දක්වා බලපත්‍ර අළුත් කිරීමට බලපත්‍ර ගාස්තුව හා සමාන දඩ මුදලක් ද ගෙවිය යුතුයි.

4. 1963 මාර්තු මස 31 වැනිදයින් පෙර අළුත් වැඩියා නොකරන ලද සෑම බලපත්‍රයක් සඳහාම නඩු පවරන බවද මෙයින් දනුම් දෙමි.

ඇස්. කදිර්කාමනාදන්,
හම්බන්තොට දිස්ත්‍රික්කයේ වැඩබලන ආණ්ඩුවේ ඒජන්තතැන.

1962.10.25 වැනි දින,
හම්බන්තොට කච්චේරියේ දීය.
11-250

---

## අංක 52/62 දරණ ආනයන පාලන දන්වීම

### වෙළඳාම ලාංකික කිරීම—ලියා පදිංචි වූ ලාංකික වෙළෙඳුන්

### ලැයිස්තු අංක : සීටී. 5/62

1962 දෙසැම්බර් මස 31 වැනි දින තෙක් වලංගු සාමාන්‍ය ආනයන බලපත්‍ර පහත සඳහන් ලියා පදිංචි ලාංකික වෙළෙඳුන් වෙත නිකුත් කර ඇත :—

(1962 අගෝස්තු 11 වැනි දින හා 1962 ඔක්තෝබර් 20 වැනි දින අතර කරන ලද ලියා පදිංචියන් මෙම ලැයිස්තුවට ඇතුළත් ය.)

| නම | ලිපිනය | ලියා පදිංචි කළ අංකය | |
|---|---|---|---|
| සීමාසහිත අබ්දුරාමන් සහ සමාගම, එම්. එස්. ... | 1, තුන්වැනි හරස් වීදිය, කොළඹ 11 ... | ඒ | 23/69/415 බී. |
| සීමාසහිත ඇසෝෂියේටඩ් කේබල්ස් ... ... | 185, යූනියන් පෙදෙස, කොළඹ 2 ... | ඒ | 583/293/1986 සී. |
| සීමාසහිත සිලෝන් ටයර් රිබිල්ඩිං කොම්පැණි, ද ... | 63, ජේතවන පාර, කොළඹ 14 ... ... | සී | 308/167/246 බී. |
| සීමාසහිත සිලෝන් බල්බ්ස් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්ස් ... | 59, රොඩනි වීදිය, කොළඹ 8 ... ... | සී | 554/304/1987 සී. |
| ද සිල්වා, එස්. ආර්. ... ... ... | 7, කැනල් රෝ කොටුව, කොළඹ 1 ... | ඩී | 377/192/1989 ඒ. |
| සීමාසහිත එලිෆන්ට් ලයිට් කෝපරේෂන් ... ... | 323, යූනියන් පෙදෙස, කොළඹ 2 ... | ඊ | 183/97/1988 සී. |
| ඉන්ටර් නැෂනල් ඒජන්සි, ද ... ... | 66, ශාන්ත ජෝසප්ස් වීදිය, කොළඹ 14 ... | අයි | 32/23/804 බී. |
| පත්මා, ඉන්ඩස්ට්‍රීස් ... ... ... | 19, රජමාවත පාර, රත්මලාන ... ... | පී | 446/238/1985 බී. |
| සීමාසහිත පුංචි සිංඤ්ඤෝ සහ පුත්‍රයෝ ... ... | 23, ක්වීන්ස් පාර, කොළඹ 1 ... ... | පී | 135/22/263 බී. |
| සීමාසහිත ක්වීන්ස් කොන්ෆෙක් ෂනරීස් ... ... | 861, අළුත්මාවත පාර, කොළඹ 15 ... | ක්‍යු | 1/3/724 බී. |
| කුර්බාන් හුසේන් සහ සහෝදරයෝ ... ... | 279, වොක්සෝල් වීදිය, කොළඹ 2 ... | ක්‍යු | 6/4/822 ඒ. |
| රත්නා කොම්පැණි ... ... ... | 13, මාකට් වීදිය, කොළඹ 11 ... ... | ආර් | 357/171/1990 ඒ. |
| සීමාසහිත සංගරලිංගම් පිල්ලෙයි සහ සමාගම, ඒ. එස්. එස්.... | 136, පංචිකාවත්ත පාර, කොළඹ 10 ... | එස් | 591/284/280 බී. |
| ෂනුල් හමීඩ් හජ්ජියාර් සහ පුත්‍රයෝ, එම්. එම්. ... | 13, වෙල්ල වීදිය, කොළඹ 12 ... ... | එස් | 798/385/1607 බී. |
| සීමාසහිත ෂෝ වොලස් ඇන්ඩ් හෙජස් ... ... | 363, කොල්ලුපිටිය පාර, කොළඹ 3 ... | එස් | 855/420/1984 සී. |
| සින්නදුරේ සහ සහෝදරයෝ, එස්. ... ... | 39, කේ. කේ. එස්. පාර, යාපනය ... ... | එස් | 64/71/154 බී. |
| වඩුඩ්, ඒ. සී. ඒ. ... ... ... | 361, ග්‍රෑන්ඩ්පාස් පාර, කොළඹ 14... ... | ඩබ් : | 234/135/1766 ඒ. |

2. 1962 මැයි 4 වැනි දින හා අංක 13,066 සහ 1962 ජූනි 8 වැනි දින හා අංක 13,162 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රවල පළ වූ පිළිවෙළින් අංක සී. ටී. 1/62 සහ සීටී : 2/62 දරණ ලැයිස්තුවල යට දක්වෙන ලියා පදිංචි අංක ඉදිරිපිට පෙන්වා ඇති ලිපිනයන් වෙනුවට පහත සඳහන් ලිපිනයන් යෙදිය යුතුය :—

| නම | ලිපිනය | ලියා පදිංචි කළ අංකය | |
|---|---|---|---|
| අබ්දුල් සතාර් හජී යූසුෆ් සහ සමාගම ... | 65-2/1, වජ්ගොඩනැගිල්ල, බංගසාල වීදිය, කොළඹ 11 | ඒ | 556/278/1828 ඒ. |
| සීමාසහිත ඊස්ටර්න් මර්චන්ට්ස් ... ... | 50, ජෙනරල්ස් ලේක් පාර, කොළඹ 2 ... | ඊ | 170/88/1666 බී. |
| මෙසන් මැක්ෂා ... ... ... | 256/1, වොක්සෝල් වීදිය, කොළඹ 2 ... | එම් | 674/292/1875 ඒ. |
| රේඩියන්ට් ග්ලාස් හවුස් ... ... ... | 14, පහත මාලය, තරුණ බෞද්ධ සමිති ගොඩනැගිල්ල කෙළින් වීදිය, කොළඹ 1 | ආර් | 354/167/1934 බී. |
| සදර්න් මෝටර්ස් ... ... ... | 413, ඩාලි පාර, කොළඹ 10 ... ... | එස් | 815/392/1691 බී. |

3. 1962 මැයි 4 වැනි දින හා අංක 13,066 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ අංක සීටී : 1/62 දරණ ලැයිස්තුවේ නම සඳහන් සීමාසහිත මිට්සුබි—සිලෝන් මහත්වරුන් (සාමාන්‍ය ආනයන බලපත්‍ර අංකය : එම් 624/260/1508 සී) තම වෙළඳ නාමය සහ ලිපිනය " සීමාසහිත මැරිටයිම් කෝපරේෂන්, 50/1, පාක් වීදිය, කොළඹ 2 " යනුවෙන් වෙනස් කර ඇත.

සී. මයිල්වාගනම්,
ආනයන සහ අපනයන පාලක.

1962 ඔක්තෝබර් 25 දින,
කොළඹ දී ය.

11—90/1

---

## ආනයන පාලන නිවේදන අංක 53/62

### වෙළඳම ලාංකික කිරීම—ලියා පදිංචි වූ ලාංකික ඉන්ඩෙන්ට් ඒජන්තවරු

### ලැයිස්තු අංක : අයිඑන්ඩී. 3/62

පහත නම් සඳහන් අය 1962 වසර සඳහා ලාංකික ඉන්ඩෙන්ට් ඒජන්තවරුන් වශයෙන් ලියා පදිංචි කර ඇත :—

(1962 අගෝස්තු 11 වැනි දින හා 1962 ඔක්තෝබර් 20 වැනි දින අතර කරන ලද ලියා පදිංචියන් මෙම ලැයිස්තුවට ඇතුළත්ය.)

| නම | ලිපිනය | ලියා පදිංචි අංකය | |
|---|---|---|---|
| එලයිඩ් ට්‍රේඩ්ස් කෝපරේෂන් ... | 87, පංචිකාවත්ත පාර, කොළඹ 10 ... | අයිඑන්ඩී : ඒ | 1/8/99 ඒ. |
| සීමාසහිත ගැමුණු ට්‍රේඩ්ස් ... | 61, අභ්‍යාස විද්‍යාලය පාර, කොළඹ 4 ... | අයිඑන්ඩී : ජී | 18/11/270 බී. |
| ජෙනරල් සප්ලයර්ස් ... | 134, කෙයිසර් වීදිය, කොළඹ 11 ... | අයිඑන්ඩී : ජී | 14/12/271 බී. |
| ත්‍යාගරාජා සහ පුත්‍රයෝ, ටී. ... | 99, කින්සි පාර, කොළඹ 7 ... ... | අයිඑන්ඩී : ටී. | 17/11/272 බී |
| යැස්මින් ට්‍රේඩිං ඒජන්සි... ... | 24, ෆේජ්බ්ස් පටු මාවත, මරදන, කොළඹ 10 ... | අයිඑන්ඩී : වයි | 4/2/269 ඒ. |

(2) 1962 ජුනි මස 1 වැනි දින හා අංක 13,145 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ අංක අයිඑන්ඩී : 1/62 දරණ ලැයිස්තුවේ යට දක්වෙන ලියාපදිංචි අංක ඉදිරිපිට පෙන්වා ඇති ලිපිනයන් වෙනුවට පහත සඳහන් ලිපිනයන් යෙදිය යුතුය :—

| නම | ලිපිනය | ලියාපදිංචි අංකය |
|---|---|---|
| බූපති කොමර්ෂල් කොම්පැණි ... ... | ... 222–224, කෙයිසර් වීදිය, කොළඹ 11 | ... අයිඑන්ඩී : බී–16/7/234 ඒ. |
| යුනිවර්සල් ඒජන්සි ... ... | ... 79, පළමුවැනි හරස් වීදිය, කොළඹ 11 | ... අයිඑන්ඩී : යූ–6/6/63 ඒ. |

සී. මයිල්වාගනම්,
ආනයන හා අපනයන පාලක.

1962 ඔක්තෝබර් 25 වැනි දින,
කොළඹ දී ය.

11—90/2

---

## ප්‍රකාශනයයි

නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ තම්පලකාමම් පත්තු කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ තම්පලකාමම් දකුණු ජනපදය සහ වෙන්ඩර්සන් පුර ජනපදයේ ගවයින් අතර "රක්-තාංශ්‍රව" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම, 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදෙශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට : නගරයේ සහ ග්‍රේවෙට්ස් ආදායම් පාලක නිලධාරි කොට්ඨාශය ; දකුණට : මහවැලි ගඟ සහ කළුගඟ ; නැගෙනහිරට : කොට්ටියාර් බොක්ක ; බස්නාහිරට : ත්‍රිකුණාමල-නුවර පාරේ 84 වැනි සැතැපුම් කණුවේ සිට නගරයේ සහ ග්‍රේවෙට්ස් ආදායම් පාලක නිලධාරි කොට්ඨාශ සහ කඩුකුලම් බටහිර පත්තුවේ දකුණු මායිම හමුවන තෙක් විහිද යන කල්පිත රේඛාව.

2. මෙම ආඥාපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශය ඒ ඒ නිලධාරීන් විසින් නිත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර ත්‍රිකුණාමල පශු වෛද්‍ය තැනගෙන් හෝ තම්පලකාමම් පත්තු කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩි දුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශය අද දින පටන් වලංගු වන බව දත යුතු යි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 ඔක්තෝබර් මස 25 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරිගේ කාර්යාලයේ දී ය.

11-149

---

## ප්‍රකාශනයයි

බටහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ කල්දේමුල්ල, කටුබැද්ද, ඉඩම සහ උයන, මෙරටුමුල්ල රාවතාවත්ත ගම්පති කොට්ඨාශවල ගවයින් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම, 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට : කොළඹ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශය ; දකුණට : කොරලවැල්ල ගම්පති කොට්ඨාශය ; නැගෙනහිරට : බොල්ගොඩ ගඟ ; බස්නාහිරට : මුහුද.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනා ලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීතිමාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර පිළියන්දල පශු වෛද්‍ය තැනගෙන් හෝ සල්පිටි කෝරළේ කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතු යි.

අබේරත්න බණ්ඩාරනායක.
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 ඔක්තෝබර 24 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරිගේ
කාර්යාලයේ දී ය.

11-169

---

## ප්‍රකාශනයයි

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණිය හත්පත්තුව කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ පොළඹේ ගම්පති කොට්ඨාශයේ හැඳල සහ හුම්බත්ගමුවේ ගවයන් අතර "මුව සහ කුර' නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම, 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට : හැඳල-පොල්පිටිය මාවත ; දකුණට : කොරදොළුව ගමේ මායිම ; නැගෙනහිරට : කොළඹ-කුරුණෑගල මාවත ; බස්නාහිරට කොරදොළුව ගමේ මායිම.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්තකරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර පොල්ගහවෙල පශු වෛද්‍ය තැනගෙන් හෝ දඹදෙණිය හත්පත්තුව කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩි දුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගුවන බව දත යුතුයි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 ඔක්තෝබර් 24 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරිගේ
කාර්යාලයේ දී ය.

11-179

---

## ර/විද්‍යාධර්ම පිරිවෙන, ඇල්ලවත්ත, රාස්සගල

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඇල්ලවත්තේ පිහිටි ඉහත සඳහන් පිරිවෙන රජයේ ආධාර ලබන පිරිවෙනක් ලෙස ලියාපදිංචි කිරීමට පූජ්‍ය කළුපහන ධම්මෝභාස ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ.

මේ දැන්වීම ප්‍රසිද්ධ කළ දිනයේ සිට තිස් දවසක් ඇතුළත මේ ඉල්ලීමට විරුද්ධතාවයක් ඇති නම් මාවෙත දැන්විය යුතුය.

ඇස්. ඇෆ්. ද සිල්වා,
අධ්‍යාපනාධ්‍යක්ෂ.

ඊ. ඇස්. බී. 13,
1962 ක්වූ ඔක්තෝබර් මස 20 දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදිය.
11-40

## කො/විද්‍යාවර්ධන පිරිවෙන, දෙහිවල

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ දෙහිවල වෛද්‍ය පාරේ පිහිටි ඉහත නම් සඳහන් පිරිවෙන රජයේ ආධාර ලබන පිරිවෙනක් ලෙස ලියාපදිංචි කිරීමට කොටවිල දීපානන්ද ස්ථවිරයන් වහන්සේ ගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. මේ දැන්වීම ප්‍රසිද්ධ කළ දිනයේ සිට තිස් දවසක් ඇතුළත මේ ඉල්ලීමට විරුඬතාවයක් ඇති නම් මා වෙත දැන්විය යුතුයි.

ඇස්. ඇෆ්. ද සිල්වා,
අධ්‍යාපනාධ්‍යක්ෂ.

ඊ. එස්. බී. 67,
1962 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ 2, මැලේ වීදිය,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

11-43

---

යොමු අංකය : පීවීඑස්. 241.

## සමාගම් ආඥපනත (145 වැනි පරිච්ඡේදය)

### 227 (4) වැනි වගන්තිය යටතේ "සීමාසහිත බවුස්ටෙඩ් බ්‍රදර්ස්" විසුරුවා හැරීමේ දැන්වීම

### සාමාජිකයින්ගේ ඉච්ඡානුග නිමා කිරීම

ඈවර කැරෙමින් පවත්නා "සීමාසහිත බවුස්ටෙඩ් බ්‍රදර්ස්" සමාගමේ අවසාන නිමා කිරීමේ රැස්වීමේ වාර්තාව හා සමග ඈවර කරුවන්ගේ ගිණුමේ පිටපතක් ලැබ 1962 ඔක්තෝබර් මස 15 වැනි දින ලියාපදිංචි කරන ලද හෙයින්,

යථෝක්ත දින සිට තෙමසක් ඉකුත් වූ පසු "සීමාසහිත බවුස්ටෙඩ් බ්‍රදර්ස්" සමාගම, සමාගම් ආඥපනතේ (145 වැනි පරිච්ඡේදය) 227(4) වැනි වගන්තියේ විධිවිධාන යටතේ විසුරුවා හරින ලද සේ සැලැකෙන බව දැනගනිත්වා.

ඩබ්ලිව්. ඇම්. සෙල්ලසියා,
සමාගම් රෙජිස්ට්‍රාර්.

1962 ඔක්තෝබර් මස 19 වැනි දින,
කොළඹ 1, සමාගම් රෙජිස්ට්‍රාර්
දෙපාර්තමේන්තුවේ දීය.

11-130

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

### රථ වාහනයන්ට අවහිර වීම

අවිස්සාවේල්ල දිස්ත්‍රික්කය සබරගමු කොට්ඨාශය

කොළඹ-අවිස්සාවේල්ල-ගිනිගත්හේන පාර සියලු රථ වාහනයන්ට දැන් විවෘත ව පවතී.

සි. මා. පෙරේරා,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

11-246

---

## "සුරාබදු ආඥපනත" පිළිබඳ දැන්වීම්

### කළුතර දිස්ත්‍රික්කයේ පානදුර නගර සභාවේ අංක 6 දරණ කොට්ඨාශයේ පිහිටි අංක 4 දරණ වලපොලපට්ටිය අරක්කු තැබෑරුම වැසීම පිළිබඳ පැවැත්වෙන ඡන්ද විමසීම

අංක 180, 187, 194, 221, 225, 231, සහ 483 දරණ සුරාබදු නිවේදන වලින් වෙනස් කරන්නට යෙදුන වර්ෂ 1925 ක්වූ අගෝස්තු මස 14 වැනි දින නිකුත් කළ අංක 7,478 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරණ ලද අංක 146 දරණ සුරාබදු නිවේදනයේ 6 වැනි වගන්තිය යටතේ ලැබී තිබෙන බලය අනුව, කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තැන විසින් පහත දැක්වෙන කොට්ඨාශය තුල පදිංචි ඡන්දදායකයින්ගේ සියයට විසිපහක සංඛ්‍යාවෙන් වැඩි කොටසක් පහත සඳහන් තැබෑරුම 1963 ඔක්තෝබර් මස 1 වැනිද සිට වසා දැමීමට කැමතිද යනු තෝරා ගැනීම පිණිස ඡන්ද විමසීමට මෙහි පහත සඳහන් දිනය, වේලාව සහ ස්ථානයද නියම කර තිබෙන බැව් මෙයින් දන්වමි. 1962 ඔක්තෝබර් මස 16 වැනි දින සහතික කරණ ලද අන්තිම ඡන්ද ලැයිස්තුවෙහි නම් අඩංගු අයට හැර වෙනත් අයට ඡන්දය දීමට නොහැක:—

| තැබෑරුමේ නම | දිනය | වේලාව | ඡන්දය දීමේ ස්ථානය | ඡන්ද කොට්ඨාශ |
|---|---|---|---|---|
| අංක 4 දරණ වලපොලපට්ටිය අරක්කු තැබෑරුම | 1962 දෙසැම්බර් මස 15 වැනිද | පෙ.ව. 8.00 සිට දවල් 12.00 දක්වා ; ප.ව. 1.00 සිට ප.ව. 6.00 | පානදුර නගර සභාවේ අංක 6 දරණ කොට්ඨාශයේ කෝන්ගහ වත්ත නමැති ඉඩමේ තනා ඇති තාවකාලික ගොඩනැගිල්ල | පානදුර නගර සභාවේ අංක 6 සහ 7 දරණ කොට්ඨාශ |

වී. පතිරණ,
කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1962 ඔක්තෝබර් මස 22 වැනි දින,
කළුතර කච්චේරියේදී.
11-31

---

ඇල්. ඞී.—බී. 29/36.

## සුරාබදු ආඥපනත

### අංක 508 දරණ සුරාබදු නිවේදනය

(52 වෙනි අධිකාරය වන) සුරාබදු ආඥපනතේ 25 වෙනි වගන්තිය යටතේ 1912 දෙසැම්බර් 13 වෙනි දිනය හා අංක 6,536 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක 1 දරණ සුරාබදු නිවේදනයෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 1953 අගෝස්තු මස 14 වෙනි දින හා අංක 10,564 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක 429 දරණ සුරාබදු නිවේදනයෙන් අවසාන වරට සංශෝධනය කරනු ලැබූ, 1939 දෙසැම්බර් මස 15 වෙනි දිනය හා අංක 8,560 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක 351 දරණ සුරාබදු නිවේදනය පහත පෙනෙන පරිදි තවදුරටත් සංශෝධනය විය යුතු බැව් සුරාබදු කොමසාරිස් මෙයින් නියම කරයි :—

(1) III වෙනි කරුණට ඉක්බිතිව "ආකෘති පත්‍ර" යන ශීර්ෂය යටතේ පහත දැක්වෙන කරුණ, එනම්—

(iv) රා බෝතල කිරීමේ හා විකිණීමේ කාර්යය සඳහා රා ලබාගැනීම පිණිස විශේෂ බලපත්‍රය යන්න යෙදීමෙන් ද ;

(2) එහි (I) වෙනි ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය, එනම්—

"(A) රා බෝතල කිරීම හා විකිණීම සඳහා බලපත්‍ර ලත් ස්ථානයකට රා සැපයීමට නිකුත් කරන ලබන සෑම බලපත්‍රයක්ම, සුරාබදු ඊ 2ඒ දරණ ආකෘති පත්‍රයෙහි විය යුතුය. (291 වෙනි සුරාබදු නිවේදනය බලන්න)" යන්න ; හා

(3) එහි පළමුවෙනි උපලේඛනයෙහි 11 වෙනි කොටසෙහි—

(අ) 6 වෙනි කොන්දේසියෙහි "අයදුම්පතෙහි 4 වෙනි කොටුවෙහි සඳහන් අනුමත කරනු ලැබූ විකුණුම් ස්ථානය නොවන අන් ස්ථානයකට අධිරාජ්‍ය ගැලුමෙහි හයෙන් එක" යන වචන හා ඉලක්කම් වෙනුවට "අයදුම් පතෙහි 4 වෙනි කොටුවෙහි සඳහන් අනුමත කරනු ලැබූ විකුණුම් ස්ථානය නොවන අන් ස්ථානයකට හෝ රා බෝතල කර විකිණීමට බලපත්‍ර ලත් ස්ථානයකට නොවන යම් ස්ථානයකට අධිරාජ්‍ය ගැලුමෙහි තුනෙන් එක" යන වචන හා ඉලක්කම් යෙදීමෙන් ද;

(ආ) 7 වෙනි කොන්දේසියේ "රා තැබෑරුම" යන වචනය වෙනුවට "රා බෝතල කිරීමට හා විකිණීමට බලපත්‍ර ලත් ඕනෑම අයකුට හෝ" යන වචන යෙදීමෙන් ද;

(ඇ) 16 (ඇළ්) දරණ කොන්දේසිය අවසානයෙහි පහත සඳහන් එනම් :—"රා බෝතල කර විකිණීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති විටක, වෙනයම් කරුණක් නිසා නොව එම රා බෝතල කර විකිණීම සඳහා පමණක් සුරාබදු කොමසාරිස් විසින් නියම කරනු ලැබිය හැකි පරිදි, යම් ගස් ගණනකට සුරාබදු ට් 2ඒ දරණ ආකෘති පත්‍රයෙහි වෙනම බලපත්‍රයක් නිකුත් කළ යුතුය. එකී බලපත්‍ර ප්‍රදානය සඳහා ගාස්තුව, ප්‍රදේශයේ ගස්බදු ක්‍රමය යටතේ ගස්බදු අයකරගන්නා ක්‍රමයට සමානව ගණන් බැලිය යුතුය."

(ඈ) 17 වෙනි කොන්දේසියේ 4 වෙනි පේලියේ "රා පොලවල්" යන වචන වෙනුවට "රා පොලවල් හෝ රා බෝතල කිරීමට හා විකිණීමට බලපත්‍ර ලත් ස්ථාන හෝ" යන වචන යෙදීමෙන් ද වේ.

ඊ. බී. වඩුගොඩපිටිය,
සුරාබදු කොමසාරිස්.

1962 ඔක්තෝබර් 24 වැනි දින,
කායාලයේ දී ය.

කොළඹ.

11-249

---

## ආණ්ඩුවේ නිවේදන (1498 වැනි පිට හා සම්බන්ධයි)

8 වැනි සම්බන්ධය

### 1961 කේ අංකය 65 දරණ මුදල් පනත

1961 කේ අංකය 65 දරණ මුදල් පනතේ 27 වැනි හා 60 වැනි වගන්ති යටතේ මුදල් ඇමැති තුමා විසින් පනවන ලද නියෝගය.

සී. පී. ද සිල්වා,
මුදල් ඇමැති.

1962 ඔක්තෝබර් 29 වැනි දා,
කොළඹ දී ය.

**නියෝගය**

1962 මැයි 25 වැනි දිනය හා 13,135 අංකය දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරණ ලදුව පසුව සංශෝධනය කරණ ලද 1962 වෙළෙඳ බදු නියෝග පහත සඳහන් පරිදි තව දුරටත් මෙයින් සංශෝධනය කරණු ලැබේ :—

(1) 7, 8, 9, 10, 12, 17 සහ 18 යන නියෝගවල "නිසි වෙළෙඳ බදු නිලධරයා" යන්න යෙදී ඇති සෑම ස්ථානයකම ඒ යෙදුම වෙනුවට "නිසි බලධරයා හෝ නිසි බලධරයා විසින් බලය දෙනු ලැබූ අන් කිසි නිලධරයකු" යන යෙදුම ආදේශ කිරීමෙන්, සහ

(2) 16 වැනි නියෝගය වෙනුවට පහත සඳහන් නියෝගය ආදේශ කිරීමෙන් :—

"16. මේ නියෝග ක්‍රියාත්මක වූවාට පසු, හැකි ඉක්මණින්, දිවයින තුළ පදිංචි ව සිටින්නා වූ ලියාපදිංචි කරණු ලැබූ සෑම කෙනකුගේ ම නම හා ලිපිනයත් ඔවුන් විසින් පවත්වා ගෙන යන ව්‍යාපාරවල ස්වභාවයත්, නිසි බලධරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරවිය යුතු යි."

10-1110

---

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3·30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණු ලබන ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරණු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිඬ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරණ කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරණු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඬ කරණු නො ලැබේ.

10. 1962 ජූලි මස 16 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණ ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 10 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 110 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 220 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරණු ලබන ගාස්තුව අය කරණු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

13. දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. ශ. | | පිටරට රු. ශ. |
|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 22 50 | ... | 35 50 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 12 50 | ... | 18 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 20 0 | ... | 28 0 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිල රු. ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|---|
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී එක කොටසක් ... ... ... | 0 25 | ... | 0 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, එක කොටසක් ... ... ... | 0 50 | ... | 0 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 10 | ... | 0 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 20 | ... | 0 15 |

**දායක මුදල් භාරගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.**

ලංකාවේ වැලව්වේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි